කොටපොළ ප්‍රාදේශීය සභාව,
<u>මාතර දිස්ත්‍රික්කය.</u>

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කොටපොළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී රු.236,500 ක් වටිනා යන්ත්‍ර, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී ඉඩම් ගොඩනැඟිලි සංවර්ධනය සඳහා දරන ලද රු.1,239,513 ක වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී ඍජු ශ්‍රම පදනම මත ඉටු කළ කර්මාන්ත සඳහා වූ වියදම් රු.108,500 ක්, ප්‍රාග්ධන වියදම් යටතේ වැඩිපුර දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.293,835 ක් වූ ස්ථාවර තැන්පත් පොළී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ආදායම ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂයේදී දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය සඳහා වාරික වශයෙන් ගෙවන ලද රු.230,347 ක් ආදායම් වියදම් ගිණුමට හර කර තිබුණි. | ණය වාරික නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (vi) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,308,444 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛන අනුව දැක්වෙන ශේෂ අතර අසමානතාවල එකතුව රු.84,029,280 ක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | කාලයක සිට පවතින අසමානතාවයන් බැවින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**(ඇ) අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ පවතින රු.255,674 ක් වූ ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද පියවර ගෙන නොතිබුණි. | ඒ පිළිබඳව සොයාබලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළයුතු වේ. | කාලයක සිට පවතින ශේෂයක් බැවින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.86,517,132 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම සමඟ ඉදිරිපත් කරමි. |
| (ii) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැරහැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුව සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) රීති 218 | සභාවට අයත් සියළු ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.10,570,380 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 15,701,806 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,192,000 | 3,133,963 | 3,059,826 | 949,081 | 1,477,000 | 1,373,838 | 1,362,574 | 874,944 |
| කුලී | 4,189,500 | 6,164,927 | 4,159,542 | 2,162,195 | 6,998,000 | 5,007,233 | 5,306,819 | 156,810 |
| බලපත්‍ර ගාස්තු | 1,003,000 | 913,956 | 913,956 | - | 928,000 | 1,666,499 | 1,666,499 | - |
| වෙනත් ආදායම් | 21,877,000 | 21,285,087 | 27,986,847 | 17,902,422 | 19,014,200 | 20,743,816 | 14,314,710 | 24,604,182 |
| එකතුව | 33,261,500 | 31,497,933 | 36,120,171 | 21,013,698 | 28,417,200 | 28,791,386 | 22,650,602 | 25,635,936 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.33,261,500 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.25,635,936 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.31,497,933 ක් සමඟ රු.57,133,869 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.36,120,171 ක් පමණක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.21,013,698 ක් විය. අයවීම් ප්‍රගතිය සියයට 63 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.3 වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| | ආරම්භක හිඟය රු.161,909 ක් වූ අතර, රු.155,560 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.317,469 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.142,765 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.174,704 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ)** | **අක්කර බදු** | | |
| | ආරම්භක හිඟය රු.209,615 ක් වූ අතර, රු.48,582 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.258,197 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.44,587 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.213,610 ක් හිඟව පැවතුණි. අයවීම් ප්‍රගතිය සියයට 17 ක් තරම් අඩු අගයක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 කුලී**
**----**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **පොළ මාළු ලැලි බදු කුලී**<br>ආරම්භක හිඟය රු.108,435 ක් වූ අතර, රු.4,338,253 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.4,446,688 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.2,557,713 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,888,975 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතුය | හිඟ මුදල් අයකර ගැනීමට නඩු පැවරීමට මූලික කටයුතු කර ඇත. |

**2.2.5 වෙනත් ආදායම්**
**------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ජල ගාස්තු**<br>ආරම්භක හිඟ ශේෂය රු.2,046,149 ක් වූ අතර, රු.3,794,433 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.5,840,582 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.3,646,942 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.2,193,640 ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.400,208 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.15,308,574 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1,300,000 ක ප්‍රමාණයක් රැස්කර තිබුණු අතර ඉන් දිරන කසළ කිලෝග්‍රෑම් 520,000 ක් පොහොර නිෂ්පාදනය සඳහා යොදාගෙන තිබුණි. ඉතිරි අපද්‍රව්‍ය අක්‍රමවත් ලෙස මුදාහැර තිබුණි. | නොදිරන කසළ ප්‍රතිචක්‍රීයකරණය කළ යුතුවේ. | පොලිතීන් සම්පිණ්ඩන යන්ත්‍රයක් අප සභාවට නොමැත. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 10 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 03 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කළ යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) **සේවක ණය**<br>සේවක ණය ලේඛනය අනුව වාරික ගෙවීම් පැහැර හැර ඇති සේවකයින් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු.33,770 ක් වූ හිඟ ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතුවේ. | මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2005 වසරින් පසු දේපළ තක්සේරුව සිදු නොකිරීමෙන් 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වසර 13 ක කාලය තුළ ඇතිවූ නව ඉදිකිරීම් වලින් මෙන්ම, නව තක්සේරු වටිනාකමින් වරිපනම් ගාස්තු අයකිරීමට නොහැකි වී තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නව තක්සේරු කටයුතු අවසන් අදියරේ පවතින බැවින් කඩිනමින් නව තක්සේරු අනුව ගාස්තු අයකරමි. |
| (ආ) | සභාවට අයත් කැබ් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා 2018 ජූලි මස 16 වන දින පෞද්ගලික ආයතනයකට පවරා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ඔක්තොම්බර් 15 දිනට පෙර අලුත්වැඩියාව සිදුකර සභාව වෙත භාර දිය යුතු බවට ගිවිසුමෙහි සඳහන් කර තිබුණි. එහෙත් 2019 මාර්තු 08 දින වන විටත් අලුත්වැඩියාව සිදුකර සභාව වෙත භාර දී නොතිබුණි. | අදාළ කාර්යය ගිවිසුම් ප්‍රකාරව සිදු කරගත යුතුවේ. | කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | 2017 අගෝස්තු 23 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 01/06/06/02 දරන ලිපිය මගින් වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරේ ස්ථිර සේවකයින් නිවාඩු ලබාගන්නා අවස්ථාවලදී හා හදිසි ආපදා තත්ත්වයන් පවතින කාලවලදී පමණක් එකී කාර්යයන් ඉටු කරවා ගැනීම සඳහා සේවකයින් 06 ක් වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුර යටතේ දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණද ඊට අනුකූල නොවී සමාලෝචිත වර්ෂයේදී වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 06 ක් දින 1344 ½ ක් සේවයේ යෙදවීම වෙනුවෙන් රු.1,369,265 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් නිවාඩු ලබා ගන්නා අවස්ථාවලදී පමණක් නොව සෞඛ්‍ය කම්කරුවන් නිවාඩු ලබාගන්නා අවස්ථාවේද සේවයේ යොදවා ගෙන ඇත. |
| (ඈ) | සභාව විසින් විවිධ අරමුදල් යටතේ මාර්ග 07 ක කුට්ටිගල් ඇතිරීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අනුමත කර තිබූ මිලට වඩා වර්ග මීටරයකට රු.205 බැගින් වර්ග මීටර් 956.52 ක් වෙනුවෙන් රු. 196,086 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ලිපිය ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | වැඩිපුර ගෙවන ලද මුදල රැඳවුම් මුදලෙන් අඩු කර ගැනීමට කටයුතු කරමි. |
| (ඉ) | 2017 නොවැම්බර් මස 30 දිනැති අංක 2048 දරන ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව සමීක්ෂණයක් සිදු කර නොතිබූ අතර 2019 මාර්තු 07 දිනැති ක්ෂේත්‍ර | ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

පරික්ෂාවේදී සවිකර ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 52 ක් වෙනුවෙන් රු.112,600 ක ගාස්තුවක් අය කර නොතිබුණි.

**3.4 ප්‍රසම්පාදනය**

**3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණ අතර වර්ෂය තුළ මිලදී ගැනීම් වෙනුවෙන් රු.7,349,182 ක් වියදම් දරා තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරමි. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සහ අරමුදල් සහ විවිධ ප්‍රතිපාදන යටතේ රු.27,000,000 ක් වූ වැඩ යෝජනා 54 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද, 2018 වර්ෂය අවසන් වන විට ඉන් රු.21,500,000 වටිනා වැඩ යෝජනා 43 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අයවැය ලේඛනය ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කළ යුතුවේ. | කර්මාන්ත 43 න් 40 ක් අවිච්ඡේද කර ඇත |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 06 ක ඉතිරිවීම් වල එකතුව රු.9,663,963 ක් වූ අතර එම අගයන් සියයට 04 සිට සියයට 86 දක්වා පරාසයක පැවතුණි. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | අයවැය සංශෝධනය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | අදායම් විෂයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.10,308,195 ක් වූ අතර එම අගයන් සියයට 08 සිට 49 දක්වා පරාසයක පැවතුණි. | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | අයවැය සංශෝධනය කිරීමට කටයුතු කරමි. |